# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

**10 ශ්‍රේණිය**

## කතෝලික ධර්මය - II

නම/ විභාග අංකයඃ .........................................

කාලය පැය 2 යි

**පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01)

i. බලාපොරොත්තුවට විරුද්ධ පාප දෙක ලියන්න.

ii. ඊශ්‍රායෙල් පූජා වර්ග බෙදිය හැකි ප්‍රධාන කොටස් දෙක ලියන්න.

iii. ලන්දේසි පීඩන සමයේ මෙරටට පැමිණි පූජකවරුන් දෙදෙනෙක් නම් කරන්න.

iv. ඊශ්‍රායෙල් ජනයා මිසරයේ දී කළ වහල් සේවාවන් දෙකක් ලියන්න.

v. දිව්‍ය පූජාව සඳහා නව ගිවිසුමේ සඳහන් නම් දෙකක් ලියන්න.

vi. ජුසේවාස් මුනිතුමා මෙරට තුළදී සිදුකළ ප්‍රාතිහාර්යය දෙකක් ලියන්න.

vii. ශුද්ධ වූ සභාවේ දෘශ්‍යමාන නායකයාව හඳුන්වන පොදු නම් දෙකක් ලියන්න.

viii. ශු. ලූක් තුමා විසින් ලියන ලද ග්‍රන්ථ දෙකක් නම් කරන්න.

ix. දේව අනාවරණයේ මූලාශ්‍ර දෙක ලියන්න.

x. පංච පුස්තකයට අයත් පොත් දෙකක් ලියන්න.

02)

i. ශු. පාවුලු තුමා ලිපි ලිවීමේ පරමාර්ථ දෙකක් ලියන්න.

ii. ශු. පාවුලු තුමාගේ හසුන් බෙදෙන ප්‍රදාන කොටස් තුන ලියන්න.

iii. ශුභාරංචිය පතල කිරීමට දේව දරුවෙකු ලෙස ඔබ කටයුතු කරන ආකාර පහක් ලියන්න.

03)

i. ප්‍රඥා සාහිත්‍යයට අයත් ග්‍රන්ථ දෙකක් නම් කරන්න.

ii. පුරාණ ගිවිසුම තුළ ප්‍රඥාව ඉදිරිපත් කර ඇති සාහිත්‍යමය ස්වරූප තුනක් ලියන්න.

iii. කිතුනු දරුවෙකු ලෙස ඔබ ප්‍රඥාවන්තව කටයුතු කළ යුතු අවස්ථා පහක් ලියන්න.

04)

i. දස පනත බෙදෙන ප්‍රධාන කොටස් දෙක ලියන්න.

ii. දේව ප්‍රේමයට විරුද්ධ පාප තුනක් ලියන්න.

iii. දේව දරුවන් ලෙස දස පනතට අනුව දිවි ගෙවමින් දේව සබඳතාව වර්ධනය කරගැනීම සඳහා ඔබ ගන්නා ක්‍රියාමාර්ග පහක් ලියා විස්තර කරන්න.

05)

i. පුරාණ ගිවිසුමේ යාග පැවැත්වීමේ පරමාර්ථ දෙක ලියන්න.

ii. පූජා බෙදෙන ප්‍රධාන කොටස් තුනක් නම් කරන්න.

iii. ක්‍රිස්තුන් වහන්සේ මුළු මිනිස් වර්ගයා වෙනුවෙන් යාග වූවා සේ ඔබට අන් අය වෙනුවෙන් වැය විය හැකි අවස්ථා පහක් ලියා විස්තර කරන්න.

06)

i. දිව්‍ය සත්ප්‍රසාදීය ලක්ෂණ දෙකක් ලියන්න.

ii. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ පිළිබඳව පූර්ව සලකුණු තුනක් ලියන්න.

iii. දිව්‍ය සත්ප්‍රසාදයේ වැඩ වසන ජීවමාන ජේසුස් වහන්සේ පාමුල හිඳ තරුණ දුවෙකු පුතෙකු ලෙස තමන්ට පැමිණෙන අභියෝගයන්ට මුහුණ දීමට අවැසි වරම් පතා යාච්ඤාවක් ලියන්න.

07)පහත සඳහන් මාතෘකාවලින් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

i. ශු. දෙවන ජුවාම් පාවුලු මුනිතුමා

ii. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීමට පෙර නිසි ලෙස සූදනම් වෙමු.

iii. ශුද්ධ වූ සභාවේ ලක්ෂණ

iv. ශුද්ධ වූ පාවුලු තුමා

v. අති උතුම් ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා